**පස්සර ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පස්සර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා  වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් මුළු වත්කම් රු.388,714,149 ක් වුවද, එදිනට මුළු හිමිකම් හා වගකීම් ශේෂය රු.388,976,530 ක් විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ වැය කර තිබුණු රු.15,702,473 ක් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු රු.3,562,438 ක ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ආපසු හරවා යැවීම, ප්‍රාග්ධන වැයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය මඟින් ලැබී තිබුණු රු.26,132,529 ක අරමුදල් ගිණුම නමින් ව්‍යාජ අරමුදල් ශේෂයක් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයන්ට අදාළව රු.160,050 ක කර්මාන්ත අත රැඳවුම් තැන්පතු, තැන්පතු ගිණුමේ සහ කර්මාන්ත ණයහිමි යටතේද දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් අයිතම 04 කට අදාළ රු.366,764 ක් අඩුවෙන් ප්‍රාග්ධනීත කර තිබුණි. | -එම- | -එම- |
| (උ) | වසර 05 කට පෙර වෙන්දේසි කර තිබුණු කැබ් රථයකට අදාළ රු.650,000 ක් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ මෝටර් රථ හා කරත්ත යටතේ ඇතුළත් කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 03 කට අදාළව ලෙජරය අනුව එකතුව හා ඊට අදාළ උපලේඛන අනුව එකතුව අතර රු.2,555,113 ක වෙනසක් විය. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති ,රීති, රෙගුලාසි හා කළ මනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) සංග්‍රහය | | | |
| | (i) 217 රීතිය | පී.එස් 46 ආකෘතිය ප්‍රකාරව සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියළුම ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | රීති සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 218 රීතිය | සමාලෝචිත වර්ෂය සඳහා සියළු ඉඩම් හා ගොඩනැඟිලි පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2)(ආ) | 2006 සහ 2014 වර්ෂ වලදී අවස්ථා 03ක දී ගෙවා තිබුණු රු.88,496 ක අත්තිකාරම් අය කරගෙන නොතිබුණි. | ශේෂ කපා හැරීම සඳහා අනුමැතියට යොමු කරන අතර කඩ හිමියන්ද දැනුවත් කළ බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| | (ii)මුදල් රෙගුලාසි 571 | ක්‍රීඩා භූමිය වෙන්කිරීම, මිල කැඳවීම්, නගර ශාලාව වෙන් කිරීම සහ විවිධ වශයෙන් නම් සඳහන් ඉකුත් තැන්පතු රු.1,055,264 ක් නියාදනය කර නොතිබුණි. | විගණන කළමනාකරණ කමිටුවේ උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ 2 ඡේදය | සභාවේ සභිකයින් 22 දෙදෙනෙකු 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැති බව. | වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,399,602 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,248,216 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **(i)** | වරිපනම් බදු | 7,181,159 | 6,271,199 | 3,599,138 | 2,672,061 | 5,974,702 | 6,644,767 | 4,290,443 | 2,354,324 |
| **(ii)** | කුලී | 20,873,872 | 20,481,563 | 15,709,218 | 4,772,345 | 29,884,112 | 21,005,458 | 11,602,690 | 9,402,768 |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 826,000 | 743,423 | 743,423 | 0 | 750,100 | 354,797 | 354,797 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 14,569,500 | 21,629,273 | 12,220,263 | 9,409,010 | 11,904,000 | 14,261,548 | 8,667,676 | 5,593,872 |
| | එකතුව | **43,450,531** | **49,125,458** | **32,272,042** | **16,853,416** | **48,512,914** | **42,266,570** | **24,915,606** | **17,350,964** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි වරිපනම් හා බදු කුලී රු.133,118 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | නිළධාරීන් දැනුවත් කර හිඟ ආදායම් රැස් කිරීමේ කාර්ය වැඩිකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි වරිපනම් හා බදු කුලී කඩිනමින් අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු.871,476 ක්, ටෙන්ඩර් කඩ කුලී රු.2,803,532 ක් ,හිඟ හිටි වෙනත් ආදායම් රු.659,087 ක් සහ හිඟ හිටි කඩකුලී රු.2,143,365 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | ඉදිරියේදී විෂය නිළධාරීන් දැනුවත් කර හිඟ ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය වැඩිකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් කඩිනමින් අය කරගත යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.4,370,763 ක් හා මුද්දර ගාස්තු රු.9,490,965 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | ඉදිරියේදී විෂය නිළධාරීන් දැනුවත් කර හිඟ ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය වැඩිකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 වර්ෂයේදී ලුණුගල ප්‍රාදේශීය සභාව ආරම්භ කරන අවස්ථාවේදී පස්සර ප්‍රාදේශීය සභාවෙන් මෝටර් රථ හා කරත්ත රු.1,117,500 ක්ද, සේවක ණය රු.675,426 ක් සහ හිඟ හිටි වෙනත් ආදායම් රු.659,087 ක් ලුණුගල ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි. එසේ පවරාදී තිබුණු වත්කම් පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම හා ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර ඉහත පැවරීම පස්සර ප්‍රාදේශීය සභාවේ ගිණුම් වලින් නිරවුල් කරගෙන නොතිබුණි. | ශේෂ සනාථ කිරිමට කිසිදු ලියවිලි හෝ විස්තර අප සතුව නොමැති බව. | ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජූලි 25 දින සිට කුඩුගල්පතන, මීදුම්පිටිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23(ආ) අනුව නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම නොදිරන ඝන අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැර කරලීම නොකළ යුතු වුවද, නොදිරන අපද්‍රව්‍ය කසළ අංගනය ආසන්නයේ විවෘත භූමියට බැහැර කර තිබුණි. | ඉදිරියේදී මුදල් යෙදවීමේ හැකියාව සලකා බලා අඩුපාඩු සම්පූර්ණ කිරීමටත් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි කසළ බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |